**කටාන ප්‍රාදේශීය සභාව - 2022**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 ව්‍යාවනය කළ මතය**

කටාන ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය කිරීමේ පදනම කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළකරනු ලැබේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිත 2.5 අනුව කුලී, වරිපනම් යන ආදායම් උපචිත පදනම මත ගිණුම් තබා තිබුණ ද සභාව විසින් ආදායම් මුදල් පදනම මත ගිණුම් තබන බව ගිණුම් ප්‍රතිපත්තිවල දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රමිත 3.20.(ආ) ඡේදයට හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති හි 265 රීතියට පටහැනිව 2023 වර්ෂය තුලදී සභාවේ සංවර්ධන ණය යටතේ ගෙවීමට නියමිත රු.2,455,012ක් ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි . | -එම- | -එම- |
| (ඇ) ප්‍රමිත 3.78 (ඇ) ඡේදයට පටහැනිව සභාව සතු රු.160,000,000ක් වූ සත්දින තැන්පතුවල වටිනාකම ජංගම නොවන ආයෝජන යටතේ දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) ප්‍රමිතයෙහි පරිශිෂ්ඨ 2 හි පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත උදෙසාවන සවිස්තරාත්මක පහදාදීම්වල EG 3.1 ප්‍රකාරව කෙරීගෙන යන යම් ප්‍රාග්ධන වැඩ වෙතොත් ඒවා දේපළ ,පිරියත සහ උපකරණ ලේඛනයේ වෙනම ප්‍රභේදයක් ලෙස පෙන්විය යුතු වුවද සභාව විසින් සමාලෝචිත වර්ෂයේ රු.4,500,000 ක් හා රු.55,803,215 ක් වූ කෙරීගෙන යන වැඩ වටිනාකම් ඉඩම් හා ගොඩනැගිලි ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (ආ) 2020 දෙසැම්බර් 30 දින ලැබී තිබුණ රු.459,374 ක් ණයගැති ගිණුමට බැර කර නොතිබුණි. | පිළිගන්නා බව.2023 ජර්නල් සටහනක් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සභාව වෙත ලැබිය යුතු ප්‍රදාන රු.32,498,936 ක් ලැබීමට ඇති ප්‍රාග්ධන ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණද සටහන 10 හි දක්වා නොතිබුණි. | ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් බෝක්කු හා කාණු අලුත්වැඩියාවට දරන ලද රු.3,405,093 ක් ප්‍රාග්ධනිත කර තිබුණි . | මුදල් වර්ෂ අවසානයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඊ) | සභාවේ ස්ථාවර තැන්පත් සඳහා සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු.28,076,102 ක් වුවත් රු.27,340,592 ක් ලෙස රු.735,510 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 ගිණුම් සකස් කිරීමේදී නිවැරදිව ගිණුම් ගත කරන බව. | -එම- |
| (උ) | වැඩ අවසන් කර ගෙවීම් ද සිදුකර තිබුණු ව්‍යාපෘති 13 කට අදාල ණයහිමි අධි වෙන්කිරීම් රු.886,812 ක් ණයහිමි ශේෂය තුළ ඇතුළත්ව තිබුණි. | කමිටු තීරණ අංක 354 අනුව ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇති බව. | -එම- |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛන අනුව ගිණුම් ශේෂ 10 ක රු.105,169,789 ක් වූ නොසැසඳුණු වෙනසක් පැවතුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම පිලියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට තටයුතු කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.34,434,002 ක් වූ ගිණුම් ශේෂ 04 ක් ලේඛන, උපලේඛන හා ජර්නල් සටහන් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මු.රෙ.371 | වර්ෂ 10 කට අධික පෙර සිට පැවතෙන ,අවස්ථා 07 කට අදාළ රු.119,957ක අත්තිකාරම් ශේෂ පියවා නොතිබුණි. | අදාල ලේඛන සොයා ගැනීමේ ගැටළුවක් පවතින බව. | ශේෂයන් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | මු.රෙ.571 | රු.3,242,046 ක් වූ වර්ෂ 2 ඉකුත් තැන්පතු නියාදනය කර නොතිබුණි. | ලිපි මඟින් දැනුවත් කර වර්ෂ 02 ඉක්මවූ තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කරන බව. | යොමුගත රෙගුලාසියට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 24 දින LGD/09/2019(I) චක්‍රලේඛය | සභාව විසින් පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම් සීමාවන් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන කමිටුව වෙත යොමු කර නිර්දේශය ලබා ගෙන තීරණයක් ගැනීමට කටයුතු කරන බව. | යොමුගත චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 පෙබරවාරි 12 දිනැති අංක LGD/10A/4/න.ගි 2019 දරන බස්නාහිර පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | මූල්‍ය නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කර වර්ගීකරණ 14ක් යටතේ සිදුකළ යුතු බව දක්වා තිබුණද ,සභාව පාරවල් , බෝක්කු ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | යොමුගත චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.102,456,438 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.167,365,734 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) වරිපනම් හා බදු | 39,191 | 55,863 | 52,960 | 34,351 | 38,557 | 33,153 | 25,449 | 33,448 |
| (ii) කුලී | 4,084 | 1,143 | 1,138 | 179 | 2,288 | 778 | 725 | 174 |
| (iii)බලපත්‍ර ගාස්තු | 2,703 | 1,689 | 1,689 | - | 2,703 | 1,163 | 1,163 | - |
| (iv)වෙනත් ආදායම් | 346,038 | 396,203 | 396,203 | - | 298,473 | 298,473 | 298,473 | - |
| | 392,016 | 454,898 | 451,990 | 34,530 | 342,021 | 333,567 | 325,810 | 33,622 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.177,878,989 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ අවස්ථා 19 කට අදාල රු.8,124,993 ක් වසර 05 කට අධික කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | පිළිගන්නා බව. | ශේෂයන් තහවුරු කර ගැනීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් කළයුතු අතර ,එම ශේෂ පියවීමට හෝ කපාහැරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතුව පැවති ඉඩම් 09 කට අදාලව ඔප්පු නොතිබුණු අතර එම ඉඩම්වලට අදාල වටිනාකම් තක්සේරුකර ගිණුම්ගත කිරීමට ද කටයුතු කර නොතිබුණි . | හිමිකම් ඔප්පු නොමැති දේපල සඳහා විධිමත් පරිදි ඔප්පු සකස් කර හිමිකම තහවුරු කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ඉඩම්වල ප්‍රමාණයන් හඳුනා ගැනීමට ද ඔප්පු පිළියෙල කර වටිනාකම් තක්සේරු කර ගැනීමට ද ගිණුම්ගත කිරීමට ද කටයුතු කළ යුතුය. |
| (ආ) | ආඩිඅම්බලම වල්පොලවත්ත ඉඩම හා වැලිහේන දවටගහවත්ත ඉඩම අත්පත් කරගෙන සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඉඩම සභාව වෙත පවරාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ඉදිරි ක්‍රියා මාර්ග සඳහා යොමු වී ඇති බව. | අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඉඩම සභාව වෙත පවරාගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 24 දිනැති අංක LGD/09/2019(I) දරන චක්‍රලේඛයේ ආකෘති පත්‍ර LG/23/1, LG/23/2, LG/23/3, LG23/4, හා LG23/ 5ප්‍රකාරව දේපළ ,පිරියත හා උපකරණවලට අදාලව ලේඛන නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛ ආකෘති පත්‍ර වලට අනුව වත්කම් ලේඛනගත කිරීම ආරම්භ කර ඇති බව. | චක්‍රලේඛයෙහි ඇතුලත් ආකෘති ප්‍රකාරව ලේඛන නඩත්තු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් 2022 වර්ෂය සඳහා විදුලි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු.8,149,344 ක් වැය කර තිබුණි. ඒ සඳහා ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම් වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | 7.11.1 අනුව කටයුතු කර නොමැති බව පිළිගන්නා අතර 1.2.1 හි අරමුණු ඉටුවන සේ ඇගයීම් කටයුතු සිදුකර ඇති බව. | මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය |